යම් පුවත් වාර්තාවක් පළ කිරීමේදී එහි අන්තර්ගත කරුණු සම්බන්ධයෙන් විශ්වසනීය මූලාශ්‍ර භාවිතා කිරීම ඔස්සේ, එම පුවත් වාර්තාවේ විශ්වසනීයත්වයද ඉහළ යන බව අපි බොහෝ අවස්ථාවන්හිදී පෙන්වා දී ඇත්තෙමු. යම් කිසි ප්‍රවෘත්ති වාර්තාවක් පළ කිරීමේදී, එහි අඩංගු කරුණු වලට පදනම් වූ මූලාශ්‍ර හෙළිකිරීමට මූලාශ්‍රයෙන් අවසරයක් නොලැබෙන අවස්ථාවකදී, මූලාශ්‍රයේ අනන්‍යතාවය මාධ්‍යවේදියා විසින් ආරක්ෂා කළ යුතු බවට විවාදයක් නොමැත. නමුත් එවන් අවස්ථාවකදී පවා තමන් ඉදිරිපත් කරන කරුණු කාරණා ඔප්පු කිරීමට සාක්ෂි සාධක මාධ්‍යවේදියා සතුව තිබිය යුතු වේ. ඒ හැරෙන්නට, පුවත් වාර්තාවක ඉදිරිපත් කරනා කරුණු වලට පාදක වූ මූලාශ්‍ර හැකි සෑම අවස්ථාවකදීම ඉදිරිපත් කළ යුතු අතර, මූලාශ්‍ර ඉදිරිපත් නොකර සිටීම සාමාන්‍ය භාවිතාව නොවිය යුතුය.
මේ අනුව බලන විට, දිවයින ඉරිදා සංග්‍රහයේ (06/27) "කෝටි හැට දාහක ටෙන්ඩරය ඉල්ලා ඇමරිකන් තානාපතිගෙන් ගම්මන්පිලට බලපෑම්" යන සිරස්තලයෙන් යුතු ලිපිය තුළ කිසිදු මූලාශ්‍රයක් සඳහන් නොවීම, පාඨක අප අවබෝධ කරගත යුත්තේ කෙසේද? මෙම පුවත තුළ මූලාශ්‍ර සඳහන් නොවූවත්, එම පුවතේ අඩංගු කාරණාවන්ට විශ්වසනීය මූලාශ්‍ර පදනම් වී තිබේද? මේ පිළිබඳව ඔබේ අදහස කුමක්ද?
මූලාශ්‍ර සඳහන් කිරීම පිළිබඳ වැඩිදුර තොරතුරු:
https://ethics.journalists.org/topics/confidential-sources/
https://www.ap.org/.../telling-the-story/anonymous-sources
https://twitter.com/EthicsEye/status/1404685739057635329
#MediaEthicsSL #lka #SinhalaNews #SundayDivaina